# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2070/7 - 2018 මැයි මස 09 වැනි බදාදා - 2018.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස - (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහය

2010 සැප්තැම්බර් මස 10 දිනැති හා අංක 1670/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 2011 මාර්තු 01 දිනැති අංක 1695/15 හා 2014 ජුනි 06 දිනැති අංක 1865/36 හා 2016 අගෝස්තු 27 දිනැති අංක 1981/99 දරන ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහය

2010 සැප්තැම්බර් මස 10 දිනැති හා අංක 1670/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 2011 මාර්තු 01 දිනැති අංක 1695/15 හා 2014 ජුනි 06 දිනැති අංක 1865/36 හා 2016 අගෝස්තු 27 දිනැති අංක 1981/99 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රවලින්* සංශෝධිත, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ.

**7.2.2.1. අධ්‍යාපන සුදුසුකම්:**

(III) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් ගණකාධිකාරි ආයතනයක ආවසරික II හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ ගිණුම්කරණය හා ව්‍යාපාර සහතිකය II හෝ ව්‍යාපාර අදියර විභාගය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත්වී සිටිය යුතුය:

**7.4.3.3**

**යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය** : 2 වැනි පරිශිෂ්ටය බලන්න

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අමතර වෘත්තීය සුදුසුකම් | 50 | 40 |
| අධ්‍යාපන සුදුසුකම් | 25 | |
| පළපුරුද්ද | 20 | |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය | 05 | |
| | 100 | 40 |

1A - G 27568 - 12 - (2018/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 2 වැනි පරිශිෂ්ටය
## ව්‍යුහගත ලකුණුදීමේ පරිපාටිය

**පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.**

අදාළ ලකුණු ලබාගැනීම පිණිස සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත සහතිකවල හා වාර්තාවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුවේ.

**2. කුසලතා මත සෘජු බඳවා ගැනීමේදී ලකුණු දීමේ ව්‍යුහගත පරිපාටිය**

| | | |
|---|---|---|
| (අ) අධ්‍යාපන සුදුසුකම්: | | <u>උපරිම 25</u> |
| | අධ්‍යාපන සුදුසුකම් | ලකුණු |
| (i) | සාමාන්‍ය උපාධිය - සාමාන්‍ය සාමාර්ථය | 10 |
| (ii) | විශේෂ උපාධිය - සාමාන්‍ය සාමාර්ථය | 12 |
| (iii) | 2 වැනි පෙළ සහිත සාමාන්‍ය උපාධිය | 12 |
| (iv) | 2 වැනි පෙළ සහිත විශේෂ උපාධිය | 13 |
| (v) | 1 වැනි පංතිය සහිත සාමාන්‍ය උපාධිය | 13 |
| (vi) | 1 වැනි පංතිය සහිත විශේෂ උපාධිය | 15 |
| (vii) | පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය,රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍ය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලන, රාජ්‍ය කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර) | 17 |
| (VIII) | **පශ්චාත් උපාධි - නිබන්ධනය රහිත** (රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය,රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය,වාණිජ්‍ය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලන, රාජ්‍ය කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර) | 20 |
| (IX | **පශ්චාත් උපාධි - නිබන්ධනය සහිත** (රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය,රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය,වාණිජ්‍ය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලන, රාජ්‍ය කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර) | 25 |

| | | |
|---|---|---|
| **(ආ) වෘත්තීය සුදුසුකම් :** | | **උපරිම 50** |
| | **වෘත්තීය සුදුසුකම්** | **ලකුණු** |
| (i) | ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ / ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමා ලාභියෙකු විය යුතුය. | 15 |
| (ii) | වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරිකII/ අන්තර් මාධ්‍ය පරීක්ෂණය/ ගිණුම්කරණ හා ව්‍යාපාරික සහතික පත්‍රය II / ව්‍යාපාර අදියර, වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ II වැනි අදියර පරීක්ෂණය, සහතිකලත් ගණකාධිකාරීන්ගේ වරලත් සංගමයේ වෘත්තීය I කොටසේ පරීක්ෂණය සමත්වීම. | 20 |
| (iii) | වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසාන I කොටසේ පරීක්ෂණය සමත්වීම, වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ III වැනි අදියර පරීක්ෂණය සමත්වීම හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ වෘත්තීය II කොටසේ පරීක්ෂණය සමත්වීම. | 30 |
| (iv) | වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම හෝ වෙනත් යම් පිළිගත් වෘත්තීය සුදුසුකම් | 40 |

(v) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරි ආයතනයේ හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ අධි සාමාජිකත්වය ලබා තිබීම හෝ වෙනත් යම් පිළිගත් වෘත්තීය සුදුසුකම් 50

(ඇ) පළපුරුද්ද: උපරිම 20

වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව ලබාගත් පළපුරුද්ද මෙහිදී සළකා බලනු ලැබේ. වර්ෂයකට ලකුණු 05 බැගින් වර්ෂ 04ක පළපුරුද්දට ලකුණු 20ක් මෙහිදි ලබා දෙනු ලබයි.

(ඇ) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා උපරිම 05

සම්මුඛ පරීක්ෂණයට මුහුණු දීමේදී දක්වන කුසලතාවය සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සැහීමට පත්වන පරිදි මෙම ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

**එකතුව** **ලකුණු 100**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි,

**ඒ. කුලතුංග,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 මාර්තු 20 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේදී ය.

05 - 583

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.